# උස පලතුරු ගස්වලට රසායනික බෙහෙත් ඉසීම අත් ස්ප්‍රේ යන්ත්‍රයක් මගින් කළ හැකිය

පේරාදෙණිය ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ කෘෂිකර්ම උපදේශක
**බී. ඩී. අරම්පොල විසිනි**

මේ සඳහා යොදා ගනු ලබන්නේ අතින් ක්‍රියා කරන පිස්ටන් වර්ගයේ ස්ප්‍රේ යන්ත්‍රයකි. මෙම වර්ගයේ යන්ත්‍රයකට ඊට අදාල අනෙකුත් කොටස් සම්බන්ධ කර පුද්ගලයින් දෙදෙනෙකුගේ ආධාර ඇතිව පොළොව මතුපිට සිටගෙන යන්ත්‍රය ක්‍රියාත්මක කරවා බිම සිට මීටර් දහයකට අඩු උසකින් යුක්තවූ පලතුරු ගස්වල දක්නට ලැබෙන කෘමිහානි හා දිලීර උවදුරු සාර්ථක ලෙස මර්ධනය කළ හැකිය. එක් පුද්ගලයෙකුට දියර පිරවූ යන්ත්‍රය තම පිටේ එල්ලාගෙන අත් ලීවරය දහ දොලොස් වාරයක් උස් පහත් කරමින් යන්ත්‍රය පීඩනයට පත්කරමින් අනෙක් අතින් ට්‍රිගරය (පාලන ලීවරය) තදකර රසායන දියරය පිටවීමට සැලැස්විය හැකිය. එලෙස දියර මුදා හැරීමේදී ක්‍රමයෙන් ටැංකියේ අඩුවන පීඩනය යළි යළිත් අත් ලීවරය ක්‍රියාත්මක කරමින් ඒකාකාර ලෙස පවත්වා ගත යුතුය. දෙවැන්නාට යන්ත්‍රයට සම්බන්ධ අනෙක් කොටස් (දිග උණ ලීය හා සම්බන්ධ වයරය) පහදාවෙන් හසුරුවමින් බිම සිට මීටර් 10 ක් හෝ ඊට පහල මට්ටමක අතු අග්ගිසි වල පවා ඇති උවදුරු මර්ධනය කිරීම සඳහා නියමිත ස්ථානයටම නොසලය හරව හරවා බෙහෙත් දියර ඉසිය හැකිය.

**අවශ්‍යවන ද්‍රව්‍ය පහත සඳහන්වේ.**

1. පිස්ටන් වර්ගයේ ස්ප්‍රේ යන්ත්‍රයක් හා කෝන් වර්ගයේ නොසලය.
2. විශ්කම්භය මි.මී. 7 ක් වූ මීටර් 10 ක් දිග වයරය.
3. වයරයේ දෙකෙලවර සම්බන්ධ කිරීම සඳහා පොටවල් සහිත පිත්තල ඇඩප්ටර් දෙකයි.
4. මීටර් 10 ( ඊට අඩු වුවත් කම් නැත)ක් පමණ උස ඇති සෘජු උණ ලීයක් හෝ වෙනත් සවිමත් සැහැල්ලු ලීයක්.
5. යන්ත්‍රය ක්‍රියා කරවීම සඳහා නිරෝගී කම්කරුවන් දෙදෙනෙක්.
6. ආරක්ෂිත ඇඳුම් කට්ටල දෙකක් මේ සඳහා හිස් වැසුම්, අත් වැසුම් හා මුඛ වැසුම් සහිත මුළු ශරීරයම වැසෙන පරිදි මසා නිමකරගත් පොලිතීන් ආවරනයක් සුදුසු වේ.
7. බලාපොරොත්තු රහිතව කෘමි රසායනික ද්‍රව්‍ය ශරීරය මත පතිත වූ අවස්ථාවකදී මැනවින් සෝදා ගැනීම සඳහා ජලය සහ සබන්.



**දියර ඉසීම සඳහා යන්ත්‍රය සූදානම් කිරීම**

ස්ප්‍රේ යන්ත්‍රයේ ට්‍රිගරය අසලින් ලාංසය ගලවා වෙන් කරන්න. මීටර් දහයක් දිග වයරයේ කෙලවර දෙකට සරිලන ආකාරයට ඇතුලතින් හා පිටතින් පොටවල් සකසා ඇති පිත්තල ඇඩප්ටර් දෙක සවි කරන්න. පිටතින් පොට කපා ඇති ඇඩප්ටරය සහිත රබර් නලය, ටැංකියේ ලාංසය ගලවා ට්‍රිගරය පැත්තට දියර කාන්දු නොවන සේ මැනවින් පොට කරකවා සංධි කළ යුතුය. වයරයේ අනෙක් කෙළවරට මුලින්ම ගලවා වෙන්කරන ලද ලාංසය සවිකරගත යුතුය. මෙලෙස සංධිකළ ස්ථාන දෙකෙන්ම කෘමි රසායනික දියර කාන්දු නොවනසේ වගබලා ගතයුතුය. ඉන් පසු දිග ලීයේ මුදුන් කෙලවරට ලාංසය

සවිකර දිග වයරය ලීය මත තබා කීප පොලකින් ලනුවලින් ගැටගසන්න. ලාංසයේ කෙල්වරට කෝන් වගීයේ නොසලය සවිකරන්න. දියර ඉසින ටැංකියට මිශ්‍රකර ගන්නා ලද කෘමි රසායනික ද්‍රාවනය පුරවා ඉසීම ආරම්භ කිරීමට පෙර ක්‍රියාකරුවන් ආරක්ෂිත ඇඳුම් කට්ටල අනිවාර්‍යයෙන්ම පැළඳ ගත යුතුය. රසායනික බෙහෙත් ඉසින ප්‍රදේශය පුරා සියුම් දියර බිංදු මීදුමක් ලෙස පැතිරෙන නිසා කුඩා ළමයින්ට හා සතුන්ට ඒ අවට ගැවසීමට ඉඩ නොදිය යුතුය. මෙම ක්‍රමයට කෘමි නාශක ඉසීම සුදුසු වන්නේ සුළඟ නොපවතින හෝ පැයට කි.මී. 10 කට අඩු වේගයකින් සුළං හමන යහපත් කාළගුණයක් ඇති උදේ වරුවක හෝ සවස් වරුවකය. දියර පුරවන ලද ස්ප්‍රේ යන්ත්‍රය එක් අයෙකු විසින් එල්ලාගෙන අත් ලීවරය ක්‍රියා කරමින් ට්‍රිගරය තදකර දියර විසර්ජනය කළයුතු අතර අනෙක් පුද්ගලයා රබර් නලය ගැටගසා ඇති දිග ලීය දෑතින් ඉහලට උස්සා කෘමි හා රෝග පාත්‍රිත ස්ථානවලට අවශ්‍ය පරිදි රසායනික ද්‍රව්‍ය ඉසිය යුතුය. මෙම ක්‍රමය අනුගමනය කරමින් ගෙවත්තේ ඇති, දෙඩම්, අලිගැට පේර, රඹුටන්. පෙයාස්., දිවුල් ආදී උස පළතුරු ගස් සහ කෝපි, කොකෝවා ආදී ගස්වල කොළ හෝ ගෙඩිවල දක්නට ලැබෙන කෘමි හා රෝග උවදුරු මර්දනය කරගත හැකි වේ.

කෘමි රසායනික ද්‍රව්‍ය සිරුරට අහිතකර බැවින් දියර ඉසීමෙන් පසු මැනවින් ස්නානය කොට පිරිසිදුවිය යුතු අතර භාවිතා කරන ලද ඇඳුම් කට්ටලයද සෝදා තැන්පත් කළයුතුය. කෘමි රසායනික ද්‍රව්‍ය භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු සියළුම ආරක්ෂක විධිවිධාන අනුගමනය කිරීමට තරයේම වගබලා ගත යුතුය.

## ඇමෙරිකා එක්සත් ජනපදයේ බඩ ඉරිඟු වගා තරඟයෙන් ජයගත් ගොවියා ගේ කථාව

ඇමෙරිකා එක්සත් ජනපදයේ එක්තරා ගොවියෙක් සෑම වසරක් පාසාම එරට විවෘත බඩ ඉරිඟු අස්වනු තරඟයෙන් ජය ගත්තේය. මෙම තරඟයට කෘෂිකර්ම ක්ෂෙත්‍රයේ පරියේෂකයින් හා ව්‍යාප්තිකාරකයින් ද සහභාගිවූ නමුත් මෙම ගොවියා සෑම වසරකම ඔවුන්ද අභිබවා උසස් අස්වනු ලැබීය. ඔහුගේ වැඩි අස්වනු ලබා ගැනීමේ රහස හෙළි කරන ලෙස ඉල්ලා සිටින නමුත් 'එය ඔබලාට අනුගමනය කල නොහැකිය'යි පවසා ගොවියා පිළිතුරු නොදී සිටියේය.

වරක් ඔහුට තරඟයේ තෑග්ග ලෙස ලෝක සවාරියක යෙදීමට අවස්ථාව සැලසුණි. එම සවාරියේදී ඉන්දියාවට පැමිණි ඔහු ප්‍රීතියෙන් උද්දාම වී 'මම කරන වැඩේ මේ ඉන්දියාවේ ගොවීන් ද කරනවා, මට හරිම සංතෝශයි' යනුවෙන් ප්‍රකාශ කලේය.

ආපසු ඇමෙරිකාවට ගිය ඔහුට කෘෂිකර්ම ක්ෂෙත්‍රයේ නිලධාරීන්ගෙන් ප්‍රශ්ණ වැලක් එල්ල විය. වැඩි අස්වනු ලබා ගැනීමේ රහස ජෛවීය ද්‍රව්‍ය පොහොර ලෙස භාවිතා කිරීම බව ගොවියා හෙළි කලේය. 'ඕකත් පජ්ජන්දැයි', ප්‍රකාශකල නිලධාරීන්, තමුන්ලාද ඊළඟ වසරේ තරඟයේදී ජෛවීය පොහොර බෙහෙවින් භාවිතා කොට තරඟයෙන් ජය ගන්නා බව ප්‍රකාශ කලෝය. ගොවියා එවිට ප්‍රකාශ කලේ තමන් වසර 25 ක් තිස්සේ ක්ෂෙත්‍රයට ජෛවීය පොහොර යෙදූ බවත්, අසල නිවෙස් වල කාබනික කසල සියල්ල වසර 25 ක් තිස්සේ ක්‍රමානුකූලව තම ක්ෂෙත්‍රයට යෙදූ බවත්, අස්වැන්න වශයෙන් බඩ ඉරිඟු ඇට පමණක් නෙලාගෙන දඩුවහල්ල, කඳ හා කොළ ක්ෂෙත්‍රයේම දිරාපත් වීමට හැරිය බවත්ය. 'පණුවෝ මගේ කෙත හාලා දෙනවා, මම පොළව කෝටුවකින් සිදුරු කරලා බඩ ඉරිඟු ඇට සිටුවනවා, උපකරණ භාවිතය අනවශ්‍යයි. ඒ තරමට මගේ පොළව මෘදුයි. ජෛවීය වසුන නිසා වල් පැළෑටි පැලවෙන්නෙ නැත. ක්ෂුද්‍ර ජීවීන් විසින් නිපදවනු ලබන හෝමෝන වගී හා ශාඛ පෝෂක හේතු කොට ගෙන බඩ ඉරිඟු ඉතා හොඳින් වැඩෙනවා. ක්ෂුද්‍ර ජීවීන් නිපදවන ප්‍රතිජීවී රසායන නිසා රෝග හා කෘමි උවදුරු අඩුයි.' යනුවෙන් ගොවියා තවදුරටත් පැවසීය.

තමන්ටත් එසේ 25 ස් වසරක් ජෛවීය ද්‍රව්‍ය යොදා ගොවියා පැරදවිය හැකි බවට නිලධාරීන් උදම් ඇනුහ. එවිට ගොවියා ප්‍රකාශ කලේ 'ඔබේ ක්ෂෙත්‍රය වසර 25 ක් පදම්වන විට මගේ ක්ෂෙත්‍රය වසර 50 ක් පදම් වෙලා බව ඔබට අමතක වෙලාද? එනිසා ඔබලාට මාව කවදාවත් පරාජය කිරීමට ලැබෙන්නේ නැහැ' යනුයි.